| 42 | FO | IM | 02 |
|---|---|---|---|

වෙත: කළමනාකරු
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්,
40, නවම් මාවත,
කොළඹ 02.

නම : ............................................
: ............................................
ලිපිනය : ............................................
: ............................................
20 ....... මස ........... වැනි දින දීය.

හිතවත් මහත්මාවරුණි,

යොමුව : .................. සම්බන්ධයෙන් වන ............... දිනැති අංක ............. දරන ස්ථිර ණයවර ලිපිය

- ගුවන් බිල්පත් අංකය : ...........................
- භාණ්ඩ තොගය : .............................
- ඉන්වොයිස්පත්‍ර වටිනාකම : ...............................

මා විසින්/ අප විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් මත නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ් ආයතනය විසින් නිකුත් කරන ලද ඉහත ශීර්ෂ දරන ස්ථිර ණයවර ලිපිය සම්බන්ධයෙන් මම/ අප විසින් මෙසේ සඳහන් කරනු ලැබේ.

සැපයුම්කරු විසින් .................. බැගින් ගුවන් ප්‍රවාහනය මගින් එවන ලද ඉහත කී භාණ්ඩ ගොඩබා ඇති බවත් ඒවා වර්තමානයේ .................................... හි ගබඩා කර ඇති බවත් මට/ අපට දැනුම් දී ඇති නමුත් ඉහත කී ණයවර ලිපිය යටතේ ගනුදෙනුකරන ලද/ ඉදිරිපත් කරන ලද මුල් ලේඛන (නැව්ගත කිරීමේ ලේඛන) මෙතෙක් අපවෙත ලැබී නොමැත.

| සළකුණු සහ අංක | ඇසුරුම් ගණන | භාණ්ඩවල ස්වභාවය | ඉන්වොයිස්පත්‍ර වටිනාකම |
|---|---|---|---|
| | | | |

මා විසින්/ අප විසින් කරන ලද ඉල්ලීමක මත නැව්ගත කිරීමේ ලේඛන අපවෙත ලැබීමට පෙර භාණ්ඩ තොගය කඩිනමින් නිෂ්කාශනයකර ගැනීමට මට/ අපට හැකියාව ලබා දීම සඳහා නැව්ගත කිරීමේ ලේඛනවල පූර්ව පිටපත් ඔබ විසින් පිටසන් කරන ලදී

ඉහත කී ආකාරයට නැව්ගත කිරීමේ ලේඛනවල පූර්ව පිටපත් මත පිටසන් කරන ලෙස මා විසින්/ අප විසින් කරන ලද ඉල්ලීමට අනුකූලව ඔබ විසින් ක්‍රියා කිරීම පිළිබඳ සැලකිල්ලට ගෙන, ඒ හා සම්බන්ධයෙන් ඇතිවිය හැකි සියලු ප්‍රතිවිපාක මෙන්ම ඉහත කී ආකාරයට නැව්ගත කිරීමේ ලේඛනවල පූර්ව පිටපත් මත ඔබ විසින් පිටසන් කිරීම හේතුවෙන් ඔබ විසින් විඳිනු ලබන හෝ දරනු ලබන විනිමය අනුපාතික උච්චාවචනයවීම් හේතුවෙන් සිදුවිය හැකි හෝ එම භාණ්ඩ මා වෙත/ අපවෙත භාරදීම හේතුවෙන් හෝ අන්‍යාකාරයකින් සිදුවිය හැකි පාඩු ඇතුලු සියලු ඉල්ලීම්, නඩු, නඩුකටයුතු, වගකීම්, හිමිකම්පෑම්, අලාභ, පාඩු, පිරිවැය සහ වියදම්වලට එරෙහිව ඔබව හානිපූරණයකර නිදහස්ව තබන බවටත්, එහි ප්‍රතිඵලයක් ලෙස හෝ ඒ හා සම්බන්ධයෙන් උපචිත විය හැකි ඔබ විසින් විඳින ලද හෝ දරන ලද සියලු ගෙවීම්, පාඩු, පිරිවැය සහ වියදම් ඉල්ලා සිටීමේ දී ඔබවෙත වහාම ගෙවනු ලබන බවටත් මා/ අප විසින් මෙයින් කොන්දේසි විරහිතව එකඟව සිටිනු ලැබේ.

ඉහත කී ආකාරයට මාගේ/ අපගේ වගකීම් යම් හේතුවක් මත සපුරාලීමට මා/ අප හට නොහැකි වුවහොත්, එවිට ඔබගේ බැංකුව සතු අනෙකුත් සියලු අයිතිවාසිකම්වලට අගතිවිරහිතව, ඔබ විසින් එසේ ඉල්ලා සිටින ලද මුදල ණය ගිණුමෙන් හර කිරීමට හෝ ඔබගේ බැංකුවේ මා/ අප සතු වෙනත් යම් ගිණුමකින් ඒ මුදල හර කිරීමට ඔබට මෙයින් බලය ලබා දෙන අතර මා/ අපහට දැනුම් දීමට යටත්ව, ඇපකර සීමාව සහ ඇපකරය බලාත්මක කිරීම, පොළිය ගෙවීම ආදිය සහ මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් කර ලද යම් ගාස්තු ඇතුලු ඉහත කී ණය හෝ වෙනත් යම් ගිණුමක් ක්‍රියාත්මක කරනු ලැබුවේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද එවැනි සියලු නියම හා කොන්දේසිවලට එසේ හරකරන ලද මුදල යටත් විය යුතු ය.

මේ යටතේ අපගේ වගකීම් සපුරාලනු තෙක් වන යම් කාලයක් දක්වා ඉහත කී ආකාරයට මා/ අප විසින් හිමිකම් කියන ලද භාණ්ඩ හෝ ඒවා විකිණීමෙන් ලද ප්‍රතිෂ්ඨා මුදල් ඔබගේ බැංකුව වෙනුවෙන් භාරයක් ලෙස අප විසින් තබාගනු ලබන බවත්, එම විකුණුම් ප්‍රතිෂ්ඨා මුදල් ඔබට ලබාගත හැකි වන පරිදි තබාගනු ලබන බවටත් මා/ අප විසින් මෙයින් වැඩිදුරටත් එකඟව සිටිනු ලැබේ. එසේ අප විසින් නිශ්කාශනය කරන ලද භාණ්ඩ අලෙවි කරනු ලබන තෙක් ගිණිගැනීම, සොරකම් කිරීම සහ අනෙකුත් සියලු සාමාන්‍ය අවදානම් හෝ ඔබ විසින් නියම කළ හැකි වෙනත් යම් හේතූන් සහ අවිනිශ්චිත සිදුවීම්වලට එරෙහිව නිසිලෙස රක්ෂණය කිරීම සිදු කරන බවට අප විසින් මෙයින් තවදුරටත් එකඟව ප්‍රතිඥා දී සිටිනු ලැබේ. තව ද, ඔබ විසින් ඉල්ලා සිටියහොත් හෝ ඉල්ලා සිටින අවස්ථාවක දී රක්ෂණ ඔප්පුව බවට පැවරීමටත්, මේ යටතේ අපගේ වගකීම් ඉටු කරන තෙක් ඒ ඔප්පුව යටතේ ගෙවිය යුතු රක්ෂණ මුදල් ඔබට ගතහැකි වන පරිදි තබා ගන්නා බවටත්, එම මුදල අපට ලැබුණහොත් එම රක්ෂණ මුදල ඔබට ගෙවන තෙක්, ඔබ වෙනුවෙන් භාරයක් ලෙස අප විසින් තබා ගන්නා බවටත් එකඟව සිටිනු ලැබේ.

එසේම මේ යටතේ ගෙවීම සිදු කිරීම සඳහා මා/ අප සතු වගකීම ලේඛනවල පැවතිය හැකි යම් විෂමතාවයක් හෝ ණයවර ලිපියේ සඳහන් යම් නියම සහ කොන්දේසිවලට අනුකූල නොවීමක් නොසලකා ඉටුකරන බවට මා/ අප විසින් මෙයින් තවදුරටත් එකඟව සිටිනු ලබන අතර ඒ සම්බන්ධයෙන් හබකර සිටීම සඳහා අපට කිසිඳු අයිතියක් නොමැති බවටද කියා සිටිනු ලැබේ.

ඉහත කී ආකාරයට මා/අප විසින් නිශ්කාශනය කරගනු ලබන භාණ්ඩවල ගුණාත්මකභාවය හෝ ප්‍රමාණය සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් ඉස්මතු කිරීම මා/ අප විසින් කළ නොහැකි බවටත්, නොඑසේ නම්, ඉහත කී භාණ්ඩ ගිවිසුමේ සඳහන් ගුණාත්මකභාවයට හෝ නියම කරන ලද විශේෂ ලක්ෂණවලට අනුකූල නොවන බවට හෝ කුමන හෝ වෙනත් පදනමක් මත මා/අප විසින් වාද නොකළ යුතු බවටත් මා/ අප විසින් මෙයින් වැඩිදුරටත් එකඟ වන අතර සෑම ආකාරයකින්ම ම මාගේ/ අපගේ සම්පූර්ණ අවදානම සහ වගකීම යටතේ මා/අප විසින් නිශ්කාෂනය කරගනු ලබන භාණ්ඩවල තත්ත්වය, ගුණාත්මකභාවය හෝ විශේෂ ලක්ෂණ සම්බන්ධයෙන් බැංකුව කිසිඳු ආකාරයකින් වගකියනු නොලබන බවට පැහැදිලිව එකඟව ඒ බව අවබෝධකරගෙන සිටිනු ලැබේ.

මේ ගිවිසුම මගින් ඔබගේ බැංකුව වෙත පවරන ලද අයිතිවාසිකම් සහ බලතල දැනට හෝ මින් පසුව අපේ ගිණුම සඳහා හෝ අපේ ගිණුම මත ඔබ විසින් දරනු ලබන වෙනත් යම් ඇපකරවලට අමතරව සහ අගතිවිරහිතව වන බවට මා/අප විසින් මෙයින් එකඟව සිටිනු ලැබේ.

ඉහත කී භාණ්ඩ ආනයනය කිරීම සම්බන්ධයෙන් සහ ඒවාට අදාල ගෙවීම් සම්බන්ධයෙන් ඔබට අවශ්‍ය වියහැකි සියලු විනිමය පාලන සහ ආනයන පාලන ලේඛන ඉල්ලා සිටීමේදී ඔබවෙත ලබා දීමට මා/ අප විසින් මෙයින් වගකීම භාරගනු ලැබේ.

ණයගැනුම්කරුගේ පූර්ව අනුමතය ලබා ගැනීමෙන් තොරව මේ යටතේ බැංකුව සතු යම් අයිතියක් හෝ සියලු අයිතීන් වෙනත් පාර්ශ්වයකට පැවරීමේ අයිතිය බැංකුව සතු වන බවට මා/ අප විසින් මෙයින් පිළිගනු ලැබේ.

මෙම ගිවිසුම ශ්‍රී ලංකාවේ නීති මගින් පාලනය විය යුතු අතර නිසි අධිකරණබලය ශ්‍රී ලංකාවේ අධිකරණ සතු විය යුතු ය.

මෙයට, විශ්වාසී

අත්සන/ බලයලත් අත්සන